රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/SLAS/Vacancies - Reply<br>(Vol – I) | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.06.19 |

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන නිවේදනයයි.

## හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ තනතුර සඳහා ද්විතීයන පදනම මත අනුයුක්ත කිරීම

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කරන ලද 2023.02.27 දිනැති නිවේදනය හා බැඳේ.

02. පීඩාවට පත් වූ පුද්ගලයින් වෙත ලබා දිය යුතු හානිපූරණයන් සඳහා වන ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමෙහිලා කටයුතු සිදු කරනු ලබන හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ තනතුර සඳහා ද්විතීයන පදනම මත නිලධාරියෙකු අනුයුක්ත කිරීමට අදාළව නිකුත් කරන ලද උක්ත නිවේදනය පහත පරිදි සංශෝධනය කිරීමට කටයුතු කරන ලෙස හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක OFR/ADM/Dir./2019-2022 හා 2023.04.21 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

02(vi). පළපුරුද්ද - උපාධි ලබා ගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 10ක පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයෙකු වීම.

03. ඒ අනුව හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ තනතුර සඳහා අනුයුක්ත වීමට මනාපය පළ කරනු ලබන ඉහත සඳහන් සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් වේ නම්, එම නිලධාරීන් වෙත ඒ සම්බන්ධයෙන් වන ලිඛිත ඉල්ලීමක්, තමාගේ ජීව දත්ත සටහනක් සමඟ ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමේ අවසන් දිනය 2023.06.30 දිනට පෙර ලෙස සංශෝධනය කරන අතර, අදාළ ලේඛන නියමිත දිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2696211-13<br>011-2166000 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2695279 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | info@pubad.gov.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.pubad.gov.lk |

04. එම තනතුරට අදාල වන කාර්යභාරය සහ වැඩිමනත් තොරතුරු අවශ්‍ය වේ නම්, "හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් - "011-2883939/ 011-2883935" වෙතින් විමසන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

පී.ඩබ්ලිව්. රාජපක්ෂ
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට

දුරකථන : 0112-698605
ෆැක්ස් : 0112 – 683651
විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com

පිටපත :

1. අධ්‍යක්ෂ ජනරාල්, හානිපූරණය සඳහා වන කාර්යාලය